
පළමුවෙනි සභාපතිත්වයේ සහ බැහැදැක ඉගැන්වීමේ පණිවුඩ, මාර්තු 2012



**ඩීටර් එෆ්. උක්ඩෝෆ්**
**සභාපතිවරයා විසිනි**
*පළමුවෙනි සභාපතිත්වයේ දෙවන උපදේශකවරයා*

# අපට අනාගතවක්තෘවරු අවශ්‍ය මන්ද?

ස්වර්ගික පියාණන්වහන්සේ සිය දරුවන්ට ප්‍රේමකරන නිසා, මෙම මැරෙන සුළු ජීවිතයේ ගමන්කිරීමට මගපෙන්වීම් සහ උපදෙස් නොමැතිව උන්වහන්සේ ඔවුන්ව අත්හැරදමා නැත. අපගේ ස්වර්ගික පියාණන්වහන්සේගේ ඉගැන්වීම්, ප්‍රාදේශීය පොත් හළකින් ගතහැකි කඩදාසිවල දැකිය හැකි සහ අනාවැකි කිවහැකි, සාමාන්‍ය ඒවා නොවේ. ඒවා සිය දරුවන්ට ප්‍රේමකරන, සියල්ල දන්නා මහා බලවත්, සෙලෙස්ටියල් දෙවියන්වහන්සේගේ ප්‍රඥාවයි. උන්වහන්සේගේ වචන යුගවල රහසයි—මෙම ජීවිතයේ සහ මතු ජීවිතයේ සතුටේ යතුරයි.

ස්වර්ගික පියාණන්වහන්සේ මෙම ප්‍රඥාව පොළොවේ සිය දරුවන්ට උන්වහන්සේගේ සේවකයන් වන අනාගතවක්තෘන්වරුන් තුළින් එළිදරව් කළසේක (බලන්න ආමොස් 3:7). ආදම්ගේ කාලයේ සිට, දෙවියන්වහන්සේ සිය දරුවන්ට උන්වහන්සේගේ කැමැත්ත හා උපදේශය අන් අයට එළිදරව්කිරීම සඳහා පත්කළ දිවැසිවරුන් තුළින් කථාකර ඇතිසේක. අනාගතවක්තෘවරුන් ආනුභාසම්පන්න ගුරුවරුන් වන අතර, නිතරම යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ විශේෂ සාක්ෂිකරුවෝ වෙති (බලන්න ධීසහගී 107:23). අනාගතවක්තෘවරු කථාකරන්නේ ඔහුගේ කාලයේ ජනතාවට පමණක්ම නොවේ, නමුත් සෑම කාලයකම ජනතාවට ඔවුහු කථාකරති. දේව දරුවන් හට ඔවුන්ගේ හඬ දෙවියන්වහන්සේගේ කැමැත්ත ලෙස ශතවර්ෂ ගණනාවක් නින්නාද වේ.

ගතවූ යුගවලින් වර්තමානය වෙනස් නොවේ ස්වාමීන්වහන්සේ අපගේ කාලයේ ජනතාවට පසුගිය කාලවලට වඩා අඩුවෙන් ප්‍රේම කරන්නේ නැත. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සභාව නැවත පිහිටුවීමේ එක් මහානුභාසම්පන්න පණිවුඩයක් නම්, දෙවියන්වහන්සේ සිය දරුවන්ට දිගටම කථාකරන බවයි! උන්වහන්සේ ස්වර්ගවල සැඟවී නැත. නමුත් පැරණි කාලයේ මෙන් වර්තමානයේද කථාකරනසේක.

ස්වාමීන්වහන්සේ සිය අනාගතවක්තෘවරුන්ට කරන එළිදරව්වලින් බොහොමයක අදහස පුද්ගලයන් සහ සමාජ ලෙස දුක් වේදනා වලින් අපව වළකාලීමය. දෙවියන්වහන්සේ කථාකරනවිට, උන්වහන්සේ තම දරුවන්ට උගන්වා, ඔවුන්ව පුබුදුවා, පිරිසිදුකර ඔවුන්ට අනතුරු අඟවනසේක. පුද්ගලයන් සහ සමාජ ඔවුන්ගේ ස්වර්ගික පියාණන්ගේ උපදෙස් නොසළකාහරින විට, පරීක්ෂාවන්, වධවේදනා සහ වෙහෙස මහන්සිවීමේ අවදානමද ඔවුන්ට පවතී.

දෙවියන්වහන්සේ සිය දරුවන්ට ප්‍රේමකරනසේක. උන්වහන්සේ එතරම් උනන්දුවෙන් අනාගතවක්තෘවරුන් තුළින් අපට අයාචනාකරන්නේ එනිසාය. අප ආදරයකරන අයට හොඳම දෙය අපට අවශ්‍ය නිසා, අපට හොඳම දෙය දීම ස්වර්ගික පියාණන්ටද අවශ්‍යවේ. උන්වහන්-

සේගේ උපදෙස් එතරම්ම තීරණාත්මක සහ සමහර අවස්ථාවලදී අත්‍යාවශ්‍ය වන්නේද එනිසාය. වර්තමානයේ අපව අත්හැර නොදමා සිය අනාගතවක්තෘවරුන් තුලින් උන්වහන්සේ සිය
කැමැත්ත අපට දිගටම එළිදරව්කරනසේක. අපගේ ඉරණම සහ අපගේ ලෝකයේ ඉරණමද, රැඳී තිබෙන්නේ දෙවියන්වහන්සේ සිය දරුවන්ට එළිදරව්කළ දේව වචනය අසමින් ඊට ඇහුම්කන්දීම මතය.

දෙවියන්වහන්සේ මනුෂ්‍ය වර්ගයාට දුන් මිළකළ නොහැකි උපදෙස් බයිබලය, මෝර්මන්ගේ පොත, දහම සහ ගිවිසුම, සහ අනගි මුතු ඇටය නම් ධර්ම ග්‍රන්ථවල ඇත. ඊට අමතරව, ස්වාමීන්වහන්සේ සිය සේවකයන් තුළින්ද කථාකරන අතර, ඉදිරි ප්‍රධාන සම්මන්ත්‍රනයේදී උන්වහන්සේ නැවතත් අපට කථාකරනසේක.

එවැන්නක් සිදුවීමට හැකිදැයි විස්මිතවන සියල්ලෝ—මෙසේ ඇසිය හැකිය, "වර්තමානයේදී අපට කථාකිරීමට දෙවියන්වහන්සේට හැකිද?"—මගේ මුළු හදින්ම මා ඔබට ආරාධනාකරන්නේ, "ඇවිත් බලන්න" (යොහාන් 1:46). ශුද්ධ ලියවිලිවල දෙවියන්වහන්සේගේ වචනය කියවන්න. පසු-දවස්වල අනාගතවක්තෘවරුන් ලබා දෙන දෙවියන්වහන්සේගේ හඬ කන්වලින් ඇසීමට කැමත්ත ඇතිව ප්‍රධාන සම්මන්ත්‍රනයට සවන්දෙන්න. ඇවිත්, අසමින් ඔබගේ හදවතින්ම බලාගන්න! මක්නිසාද ඔබ "අවංක හදවතකින් යුතුව, සැබෑ අරමුණකින්, ක්‍රිස්තුස්වහන්සේ තුල ඇදහිල්ල ඇතිව අසන්නේ නම්, [දෙවියන්වහන්සේ] නුඹලා හට ශුද්ධාත්මයාණන්ගේ බලය මගින් එහි සත්‍යය ප්‍රකාශ කරන සේක." (මොරෝනි 10:4). මෙම බලය මගින් හා තුලින් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ජීවමාන බව සහ ජීවමාන අනාගතවක්තෘ තෝමස් එස්. මොන්සන් සභාපතිවරයා තුලින්, උන්වහන්සේ සිය සභාව මෙහෙයවන බවද
මම දනිමි.

සොයුරු සොයුරියනි, දෙවියන්වහන්සේ වර්තමානයේදී අප සමග කථාකරනසේක. තවද උන්වහන්සේගේ කැමැත්ත සිය සියලුම දරුවන් උන්වහන්සේගේ හඬ අසා ඇහුම්කන් දීමය. අප එසේ කරනවිට, ස්වාමීන්වහන්සේ මෙම ජීවිතයේදී සහ මතු ලෝකවලදීද අපට ආශිර්වාදකර විශාලලෙස අපව උසුලන සේක.

## තරුණ අය

### ජීවමාන අනාගතවක්තෘවරයෙකු මගින් මගපෙන්වීම
**ක්‍රිස්ටි රීපා විසිනි**

මා 16 හැවිරිදි වියේ සිටියදී, පළමු වතාවට පුද්ගලිකවම ප්‍රධාන සම්මන්ත්‍රනයට සහභාගිවීමට මට අවස්ථාවක් ලැබින. මගේ පවුල ජීවත්වූයේ අළුජ බටහිර ඔරිගන්වලය. ප්‍රධාන සම්මන්ත්‍රනයට සහභාගිවීමට
සහ මගේ වැඩිමහල් සොහොයුරා ධර්මදූත පුහුණු මධ්‍යස්ථානයට යැවීම සඳහාත් අපි යූටා දක්වා ගියෙමු.

මා සම්මන්ත්‍රනයට ගියේ ශුද්ධාත්මයාණන් මගින් ඉගෙනගැනීමේ කැමැත්ත ඇතිවය. එහි ප්‍රතිඵලයක් ලෙස, මට ආත්මයාණන්ගේ ප්‍රකාශවීමක් ලැබුන අතර, මා සූදානම්වී නොතිබුනේ නම්, මට එය සමහරවිට නොලැබීමට ඉඩ තිබුනි.

එක් සැසිවාරයක් තුලදී, සැම කෙනෙක්ම නැගිට "Guide Us, O Thou Great Jehovah." ගීතිකාව සභාව සමග ගැයූහ. අප ගායනාකරන විට, සම්මන්ත්‍රන මධ්‍යස්ථානය අවට බැලීමට විශේෂ හැඟීමක් මට ඇතිවිය මා එසේ කළ අතර, අප සියලුදෙනාම දෙවියන්වහන්සේට උස් හඬින් ප්‍රශංසාකළ විට, එහි සිටි දහස් ගණනක ජනයාගේ එකමුතුකමේ බලයෙන් මම
වශීකෘත වීමි.

ඉන්පසුව මට ලැබුන අත්දැකීමකින්, නෙෆී ජීවන ගස දර්ශනයක් තුලින් දුටු විට, ඔහුට ඇතිවූ හැඟීම මටද ඇතිවිය, මන්ද ආත්මයාණන් මටද මෙසේ කීහ, "බලන්න" (බලන්න 1 නෙෆී 11–14). මම තෝමස් එස්. මොන්සන් සභාපතිවරයා දෙස බැලූ අතර, සභාවේ එක්සත්කම පවතින්නේ ජීවමාන අනාගත වක්තෘවරයෙකු විසින් අපව මෙහෙයවන නිසා බවට හැඟීමක් මට ඇතිවිය. ශුද්ධාත්මයාණන්ගේ සාක්ෂිය තුලින්, මොන්සන් සභාපති තුමා අපගේ කාලයේ සැබෑ අනාගතවක්තෘවරයෙක් බව මම
දනිමි, එසේම යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මෙම සභාව ඔහු තුලින් මෙහෙයවන බවද මම දනිමි.

© 2012 Intellectual Reserve, Inc. විසිනි. සියලු හිමිකම් ඇවිරිණි. ශ්‍රී ලංකාවේ මුද්‍රණයකරන ලදී. ඉංග්‍රීසි අනුමැතිය: 6/11. පරිවර්තන අනුමැතිය: 6/11. *First Presidency Message, March 2012* පරිවර්තනයයි. Sinhala. 10363 408

# මගේ රාජධානියේ දියණියෝ

ඇදහිල්ල, පවුල, සහනය

*මෙම ලිපිය අධ්‍යයනයකර, අදාල පරිදි, එය ඔබ බැහැදකින සොයුරියන් හා සාකච්ඡා-කරන්න. ඔබගේ සොහොයුරියන් ශක්තිමත්කරන සහ සහන සමිතිය ඔබගේ ජීවිතයේ ක්‍රියාකාරී කොටසක් කරගැනීමට ඔබට උපකාරවත්වන ප්‍රශ්න අසන්න.*

අපි ස්වර්ගයේ වැඩසිටින අපගේ පියාණන්වහන්සේගේ දියණියන් වන්නෙමු. අපව හඳුනන උන්වහන්සේ, අපට ප්‍රේමකරන සේක. අප සඳහා සැලසුමක්ද උන්වහන්සේට ඇත. පොළොවට පැමිණ නපුරින් යහපත තෝරාගැනීමට ඉගෙනගැනීමද එම සැලසුමේ කොටසකට ඇතුළත්ය. අපි දෙවියන්වහන්සේගේ පණත් තැබීම තෝරාගන්නා විට, අප දේව දියණියන් ලෙස අපගේ අනන්‍යතාවය අපි පිළිගන්නෙමු. මෙම දිව්‍යමය උරුමය මතකතබාගැනීමට සහන සමිතිය අපට උපකාර කරයි.

සහන සමිතිය සහ එහි ඉතිහාසය අපව ශක්තිමත්කර උපකාරකරයි. ජුලී බී. බෙක්, සහන සමිතියේ ප්‍රධාන සභාපතිනිය මෙසේ කීවාය: "දේව දියණියන් ලෙස, ඔබ සදාකාලික තනතුරු සඳහා සූදානම්වන අතර, ඔබ එකිනෙකාට කාන්තා අනන්‍යතාවයක්, ස්වභාවයක් සහ වගකීමක් ඇත. පවුල්වල, සමාජවල, මෙම සභාවේ සහ අනර්ඝ ගැලවීමේ සැලසුමේ සාර්ථකත්වය ඔබගේ ඇදහිලිමත්භාවය මඳ රඳාපවතී. … [අපගේ ස්වර්ගික පියාණන්වහන්සේ] සහන සමිතියෙන් බලාපොරොත්තුවූයේ උන්වහන්සේගේ ජනතාව ගොඩනගා, ඔවුන්ව දේවමාළිගා ආශිර්වාදවලට සූදානම්කිරීමය. උන්වහන්සේ [සහන සමිතිය] පිහිටුවූයේ සිය දියණියන් උන්වහන්සේගේ වැඩකටයුතුවලට පෙළගස්වා, උන්වහන්සේගේ රාජ්‍යය ගොඩනැගීමට සහ සයෝනයේ නිවාස ශක්තිමත්කිරීමට ඔවුන්ගේ උපකාර ලබාගැනීමටය"[1]

ස්වර්ගයේ වැඩසිටින අපගේ පියාණන්වහන්සේ උන්වහන්සේගේ රාජ්‍යය ගොඩනැගීමට උපකාරකිරීමට විශේෂිත වැඩකොටසක් අපට දී ඇතිසේක. මෙම විශේෂ වැඩ කොටස ඉටුකරගැනීමට අපට අවශ්‍ය ආත්මික දීමනා සමග උන්වහන්සේගේ ආශිර්වාදය අපට ඇත. සහන සමිතිය තුළින්, අපගේ දීමනා පාවිච්චිකර පවුල් ශක්තිමත්කර, අවශ්‍යතා ඇති අයට උපකාරකර, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ගෝලයන් ලෙස ජීවත්වන අන්දම ඉගෙනගැනීමට අවස්ථාවක්ද අපට ඇත.

ඩීටර් එෆ්. උක්ඩෝෆ්, පළවෙනි සභාපතිත්වයේ දෙවන උපදේශකවරයා, ගෝලකම ගැන මෙසේ කීවේය: "ගෝලකමේ මාවතේ ඉවසීමෙන් ගමන්කිරීම මගින්, අපගේ ඇදහිල්ලේ ප්‍රමාණය සහ අපගේ කැමැත්ත වෙනුවට දෙවියන්වහන්සේගේ කැමත්ත පිළිගැනීමට ඇති කැමැත්ත, අපි අපටම ප්‍රදර්ශනය කරන්නෙමු."[2]

අපි දේව දියණියන් ලෙස උන්වහන්සේගේ ගෝලයන් මෙන් ජීවත්වීමට පරිශ්‍රම දැරීමට මතකතබා ගමු. අප එසේ කරන විට, අපි මෙහි පොළොව මත දේව රාජ්‍යය ගොඩනැගීමට උපකාරකරමින්, උන්වහන්සේ වෙත නැවත යාමට සුදුසුකම් ලබන්නෙමු.

## *ශුද්ධ ලියවිලිවලින්*

සෙකරියා 2:10; දහම සහ ගිවිසුම 25:1, 10, 16; 138:38–39, 56; "පවුල: ලෝකයාට ප්‍රකාශනයකි" (*ලියහෝනා සහ එන්සයින්*, නොවැ. 2010, 129)

## *අපගේ ඉතිහාසයෙන්*

1842, අප්‍රේල් 28 වෙනිදා, ජෝසෆ් ස්මිත් අනාගතවක්තෘවරයා සහන සමිතියේ සොහොයුරියන්ට මෙසේ කීවේය: "දෙවියන්වහන්සේ [ඔබ] තුල ඇතුල්කර තිබෙන අනුකම්පාවන් අනුව ක්‍රියාකිරීමේ තත්වයක ඔබ දැන් තබා ඇත. …ඔබ ඔබගේ වරප්‍රසාදයන් අනුව ජීවත්වුවහොත්, දේවදූතියන් ඔබගේ මිතුරියන්වීම වැළැක්විය නොහැකිය."[3]

අන් අයට සේවයකිරීමට සහ ඇදහිල්ල වැඩිකරගැනීමට පුද්ගලයන්ට උපකාරකිරීමට සහන සමිතිය සතු බලය හඳුනාගැනීමට, ෂිනා ඩී. එච්. යන්, තුන්වෙනි සහන සමිතියේ ප්‍රධාන සභාපතිනිය, 1893 දී සොහොයුරියන්ට මෙසේ පොරොන්දුවූවාය. "ඔබ ඔබගේම හදවත්වල ගැඹුරටම හාරන්නේ නම්, අනගි මුතුඇටය, මෙම වැඩවල සාක්ෂිය, ස්වාමීන්වහන්සේගේ ආත්මයාණන්ගේ උපකාරයෙන්, ඔබට සොයාගත හැකිය."[4]

**සටහන්**

1. ජුලී බී. බෙක්, "'Daughters in My Kingdom': The History and Work of Relief Society," *ලියහෝනා*, නොවැ. 2010, 112, 114.
2. ඩීටර් එෆ්. උක්ඩෝෆ්, "The Way of the Disciple," *ලියහෝනා*, මැයි 2009, 76.
3. ජෝසෆ් ස්මිත්, *History of the Church තුලිනි*, 4:605.
4. ෂිනා ඩී. එච්. යන්, "How I Gained My Testimony of the Truth," *තරුණ කාන්තා ජර්නලය*, අප්‍රේ. 1893, 319.

### *මට කුමක් කළ හැකිද?*

**1.** දේව දියනියන් ලෙස මගේ සොහොයුරින් සතු හැකියාවන් දියුණුකරගැනීමට ඔවුන්ට උපකාරකිරීමට මට හැකිවන්නේ කෙසේද?

**2.** දහම සහ ගිවිසුම 25 තුලින් කාන්තාවන්ට දී තිබෙන උපදෙස් සහ අනතුරු අඟවීම් මගේ ජීවිතයට මා අදාළකරගන්නේ කෙසේද?

වැඩිදුර තොරතුරු සඳහා යන්න, reliefsociety.lds.org.

© 2012 by Intellectual Reserve, Inc. විසිනි. සියලු හිමිකම් ඇවිරිණි. ශ්‍රී ලංකාවේ මුද්‍රණයකරන ලදී. ඉංග්‍රීසි අනුමැතියː 6/11. පරිවර්තන අනුමැතියː 6/11. *Visiting Teaching Message, March 2012* පරිවර්තනයයි. Sinhala. 10363 408